# සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ දක්වා ඇති මත පිළිබඳ අධ්‍යයනයක්

අයි. ඩී. ගිම්හානි මලීෂා දිසානායක
කැලණිය විශ්වවිද්‍යාලය
gmaleesha315@gmail.com

**සාරසංක්ෂේපය**

භාෂාව යනු මානව වර්ගයාට පමණක් සුවිශේෂ සන්නිවේදන මාධ්‍යයක් වේ. සිංහල භාෂාවේ සම්භවය කවදා කෙසේ සිදුවුණි දැයි නිශ්චිතව ම ප්‍රකාශ කළ නොහැකි වූවත් භාෂාව පිළිබඳ තොරතුරු ගවේෂණය කරනු ලබන භාෂාවේදීන් විසින් ඒ පිළිබඳ ව විවිධ මත ඉදිරිපත් කර ඇත. ඒ අනුව විද්‍යාත්මක සහ ඓතිහාසික තොරතුරු ගවේෂණය කරමින් සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ ව දක්වා ඇති ප්‍රධාන මත කිහිපයක් පාදක කොට ගනිමින් අධ්‍යයනයක් සිදු කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වෙයි. සිංහල භාෂාව පිළිබඳ භාෂාවේදීන් දක්වා ඇති මත විමසමින් සිංහල භාෂා සම්භවය සිදු වූයේ කෙසේ ද? යන්න විමසා බැලීම මෙහි පර්යේෂණ ගැටලුව යි. අදාළ තොරතුරු ඇතුළත් ග්‍රන්ථ, ලිපි, සඟරා ආදිය ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය ලෙස  ගෙන ගුණාත්මක දත්ත ක්‍රමවේදය යටතේ සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ මත අධ්‍යයනය කරනු ලැබිණි. ඒ අනුව සිංහල භාෂාවේ සම්භවය ඉන්දු ආර්ය භාෂා ගණයක් බවට වන මතය, ව්‍යාකරණමය සහ වාක්කෝෂමය සාධක ඉදිරිපත් කරමින් ජේම්ස් කෝඩිනර්, විල්හෙල්ම් ගයිගර්, සෙනරත් පරණවිතාන වැනි උගතුන් ඉදිරිපත් කර ඇති අතර එය ඉන්දු අනාර්ය භාෂා ගණයට අයත් බව සිංහල වාක්කෝෂයේ පවතින ද්‍රාවිඩ ලක්ෂණ පදනම් කරගනිමින් තියඩෝර් ජී. පෙරේරා, රීස් ඩේවිඩ්ස් වැනි වියතුන් ප්‍රකාශ කර ඇත. තව ද සිංහල භාෂාවේ නිෂ්පන්න පද දක්නට ලැබීම හේතු කොට ගෙන සිංහල භූමියේ ම උපන් භාෂාවක් බවට ද මත ඉදිරිපත් වේ. ඒ අනුව මෙම පර්යේෂණයේ ප්‍රතිඵල වශයෙන් ඉදිරිපත් කළ හැක්කේ සිංහල භාෂාව වඩාත් භාරතීය ආභාසයට ලක්වන බව පෙනී යන කරුණක් වූවත් එය සිංහල භූමියේ ම පාරිශුද්ධ භාෂාවක් ලෙස උපත ලබා පසුකාලීන ව ඇති වූ සමාජීය කරුණු පදනම් කරගනිමින් ඉන්දු ආර්ය සහ අනාර්ය ලක්ෂණ මිශ්‍ර කරගනිමින් වර්තමානයේ ව්‍යවහාර වන තත්ත්වයට පත් වූ බව යි.

**ප්‍රමුඛ පදඃ** අනාර්ය, ආර්ය, නිෂ්පන්න, භාෂා සම්භවය, සිංහල භාෂාව

# A Study of the Opinions Expressed about the Origin of the Sinhala Language

I.D. Gimhani Maleesha Dissanayake
University Of Kelaniya
gmaleesha315@gamil.com

**Abstract**

Language is a means of communication unique to mankind. Although it is not possible to say exactly when and how the Sinhala language originated, the linguists who research the language have presented different opinions about it. Accordingly, the objective of this research is to explore the scientific and historical information and conduct a study based on some of the main opinions given about the origin of the Sinhala language. The research problem is to investigate how the Sinhala language originated based on the opinions given by linguists about the Sinhala language. Opinions on the origin of the Sinhala language were studied using books, articles, and magazines that contain relevant information as primary and secondary sources under the qualitative research method. Here scholars such as James Cordinor, Wilhelm Geiger, and Senarath Paranawithana have presented grammatical and lexical facts on the origin of the Sinhala language as an Indo-Aryan language, and based on the Dravidian features in the Sinhala lexicon, Theodore G. Perera and Rees David have stated that it belongs to the category of non-Indo Aryan languages. Moreover, due to the occurrence of words derived from the Sinhala language, it is also suggested that Sinhala is a native language. According to the results of this research, it can be presented that although the Sinhala language is more influenced by India, it was born as a pure language in the Sinhalese land itself, and based on the social facts that arose later, it became the current state of use, mixing both Indo-Aryan and non-Indo Aryan characteristics.

**Keywords:** Aryan, Language, Non-Indo Aryan, Origin of Sinhala, Sinhala Language